# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1487/3 – 2007 මාර්තු 05 වැනි සඳුදා – 2007.03.05

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 217 වන වගන්තිය සමඟ කියවිය යුතු එහි 212 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රංජිත් සියඹලාපිටිය,
*වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.*

2007 මාර්තු මස 01 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

නියෝග

1. මේ නියෝග, 2006 අංක 1 දරන බලයලත් නියෝජිතයින් අනුමත කිරීම පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග යටතේ ලියාපදිංචි කරන ලද සියළුම බලයලත් නියෝජිතයින් පිළිබඳ ලේඛනයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යා යුතුය.

3. මේ නියෝග යටතේ බලයලත් නියෝජිතයකු වශයෙන් ලියාපදිංචිවීමට අපේක්ෂිත යම් පුද්ගලයකු විසින්, එම කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් සපයනු ලබන ආකෘති පත්‍රයෙහි, ඒ සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත අයදුම් කළ යුතුය.

4. යම් පුද්ගලයෙකු වයස අවුරුදු විසිඑක සම්පූර්ණ කර ඇත්නම් සහ ශ්‍රී ලංකාව තුළ වාසය කරන ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ නම් මිස සහ, එම පුද්ගලයා.–

(අ) දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත් වූ ද, තක්සේරුකරු තනතුරෙහි එකී දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය සමත්වීමෙන් අනතුරුව අවුරුදු පහකට නොඅඩු සේවයක් ඇත්තා වූ ද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවකු ලෙස සේවය කර ඇති පුද්ගලයෙකු වන්නේ නම් ; හෝ

(ආ) සමාගම් (විගණන) නියෝග යටතේ විගණකවරයෙකු ලෙස ලියාපදිංචි වී සිටින පුද්ගලයෙකු නම් ; හෝ

(ඇ) II වන පන්තියේ විගණන අධිකාරී ධූරයට පහළ නොවන ධූරයක ශ්‍රී ලංකා විගණන සේවයෙහි සාමාජිකයෙකුව සිටියා වූ සහ තරඟ විභාගයක ප්‍රතිඵල මත එම සේවයට පත් කරනු ලැබුවා වූ පුද්ගලයෙකු වන්නේ නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ ගණකාධිකාරී සේවයේ II වන පන්තියට පහළ නොවන තත්ත්වයක, රජයේ ගණකාධිකාරී සේවයේ සාමාජිකයකුව සිටියා වූ සහ තරඟ විභාගයක ප්‍රතිඵල මත එම සේවයට පත් කරනු ලැබුවා වූ පුද්ගලයෙකු වන්නේ නම් ; හෝ

( ඉ)(i) (අ) වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික/අන්තර් සහතිකය ;

(ආ) පිරිවැය කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ වෘත්තීය පියවරෙහි I වන කොටස/පිරිවැය සහ කළමනාකරණ වරලත් ආයතනයේ අන්තර් විභාගය ;

(ඇ) සහතික ලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයේ වෘත්තීය විභාගයේ I කොටස ;

යන සුදුසුකම් අතුරෙන් එක් සුදුසුකමක්, සහ

(ii) සුදුසුකම් ලැබීමෙන් පසුව ගිණුම් පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු දහයක පළපුරුද්දක් ඇති පුද්ගලයෙකු හෝ වන්නේ නම්, මිස ඒ පුද්ගලයාට බලයලත් නියෝජිතයෙකු ලෙස ලියාපදිංචිවීමට හෝ බලයලත් නියෝජිතයන්ගේ ලේඛනයෙහි නම ඇතුළත් කරවා ගැනීමට හෝ හිමිකමක් නොමැත්තේ ය.

5. යම් පුද්ගලයෙකු.–

(අ) සිහි විකල පුද්ගලයෙකු බවට නිසි බලය ඇති අධිකරණයක් විසින් තීරණය කරනු ලැබ ඇත්නම් ; හෝ

(ආ) වස්තු භංගත්වයට පත් වූ පුද්ගලයෙකු හෝ බංකොලොත් වූවකු වශයෙන් තීරණය කරන ලදුව, ඔහුගේ වස්තු භංගත්වය හෝ බංකොලොත්භාවය මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් නොවැළැක්විය හැකි අලාභ හෝ ආපදා හේතුවෙන් උද්ගතව ඇති බවට නිසි බලය ඇති අධිකරණයක් විසින් සහතිකයක් ලබාදී නොමැති නම් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාව තුළ දී හෝ වෙනත් ස්ථානයක දී චරිත දූෂණය හා සම්බන්ධ වරදකට නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කර ඇත්නම් ; හෝ

(ඈ) වෘත්තීය විෂමාචාරයක් සම්බන්ධයෙන් වරදකරුවකු වී ඇත්නම් ;

ඒ පුද්ගලයාට බලයලත් නියෝජිතයෙකු වශයෙන් ලියාපදිංචිවීමට හෝ එලෙස ලේඛනයේ තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට හිමිකමක් නොමැත්තේ ය.

6. ලියාපදිංචිය සඳහා අයදුම් කරනු ලබන යම් පුද්ගලයෙකු මේ නියෝග යටතේ ලියාපදිංචි කිරීමට හිමිකම් ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම් ඔහු විසින් එම පුද්ගලයා ලියාපදිංචි කොට, ඔහුගේ ලියාපදිංචිය සහතික කොට එම පුද්ගලයාට ලිපියක් නිකුත් කළ යුතුය. ඔහුගේ නම කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනයෙන් ඉවත් කරනු ලැබීමකදී එම ලිපිය ආපසු ලබාගත යුතුය.

7. කිසියම් පුද්ගලයකු.–

(අ) තමාගේ නම ඉවත් කරන ලෙස ලිඛිත ඉල්ලීමක් කර ඇත්නම් ;

(ආ) 5 වන නියෝගයේ නිශ්චිතව සඳහන් අශක්නුතා කිසිවකට පාත්‍රවී ඇත්නම් ;

(ඇ) ඒ පුද්ගලයා විසින් ඔහුගේ වෘත්තීයේ තත්ත්වයෙන් සිදු කරන ලද යම් ක්‍රියාවක්, නොසැලකිලිමත්කමක් හෝ වංකභාවයක් හෝ විෂමාචාරයක් හේතුකොටගෙන, ඒ පුද්ගලයාගේ නම ලේඛනයෙන් ඉවත් කළ යුතු යැයි කොමසාරිස් ජනරාල්වරයා සලකන්නේ නම්,

කොමසාරිස් ජනරාල්වරයා විසින් සිය අනුමතය ඉවත් කොට, ඒ පුද්ගලයාගේ නම බලයලත් නියෝජිතයන්ගේ ලේඛනයෙන් ඉවත් කළ යුතුය.

8. කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ නියෝග යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති බලයලත් නියෝජිතයන්ගේ ලැයිස්තුවක් යටත් පිරිසෙයින් වර්ෂයකට වරක්වත්, ඒ වර්ෂයේ මාර්තු මස 31 වන දින ඉකුත් වීමට පෙර ගැසට් පත්‍රයේ පළ කර විය යුතු ය.

03 –597

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.